# රාජ්‍ය සේවා අන්‍යෝන්‍ය අර්ථසාධක සංගමය - 2012

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2012 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය සේවා අන්‍යෝන්‍ය අර්ථසාධක සංගමයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

2011 සහ 2012 වර්ෂවල දෙසැම්බර් 31 දිනට අදාළව කර තිබුණු භාණ්ඩ සමීක්ෂණවලදී භාවිතයට ගත නොහැකි ලෙස තීරණය කර තිබුණු විෂයයන් 05 ක ඒකක 22 ක් ස්ථාවර වත්කම් ලේඛනවලින් ඉවත් කර තිබුණු නමුත්, ඒවා අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

#### 1.2.2 නොසැසඳූ පාලන ගිණුම්

සමාලෝචිත වර්ෂය අවසානයට වර්ගීකරණය නොකළ ප්‍රේෂණ ගිණුමෙහි රු.219,697 ක්ද, විවිධ ගැලපීම් ගිණුමෙහි සාමාජික ණය වෙනුවෙන් නිරවුල් නොවූ රු.394,489 ක්ද නොසැසඳී පැවතුණි.

#### 1.2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත නිරීක්ෂණයන් කරන ලැබේ.

(අ) විවිධ ණයගැතියන් යටතේ වූ මිය ගිය සහ සාමාජිකත්වය අහිමිවී තිබුණු සාමාජිකයන්ගෙන් රු.1,998,062 ක් වූ ශේෂයක අයවිය යුතුව තිබුණි. එම ශේෂයෙන් රු.1,657,401 ක් සාමාජිකයන් 88 දෙනෙකුගෙන් වසර 1 සිට වසර 5 කට වැඩි කාලයක සිට ප්‍රදානය කරන ලද ණයවලින් අයකර ගත යුතුව තිබුණු ණය ශේෂය විය. එයින් සාමාජිකයින් 73 දෙනෙකුගෙන් අයවිය යුතු රු.1,583,060 ක ණය ශේෂයෙන් සමාලෝචිත වර්ෂය තුළ කිසිදු මුදලක් අයවී නොතිබුණි. අදාළ සාමාජිකයින්ගෙන් මුදල් අයකර ගැනීමට හෝ හිලව් කර ගැනීම සඳහා දායක මුදල් හෝ වෙනත් අයකර ගත හැකි මුදලක් සංගමය සතුව නොතිබුණු බැවින් හා එම අයගේ කිසිදු බැඳීමක් සංගමය සමඟ නොතිබුණු බැවින් රු.1,998,062 ක් වූ හිඟ හිටි ණය ශේෂ අයකර ගැනීම අවිනිශ්චිත වී තිබුණි. මෙම ණය ප්‍රදානය කිරීමේදී ඇප සුරක්ෂණ ලබා නොගැනීම නිසා මෙම තත්ත්වය ඇති වීමට හේතුවී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානය වනවිට ණය පොලී හා දායක මුදල් ගෙවීම පැහැර හැර ඇති සාමාජිකයින් 20 ක් සහ සාමාජිකත්වය අහෝසි වීම් ලිපි යවන ලද සාමාජිකයින් 04 ක ගෙන් මාස 03 සිට අවුරුදු 01 දක්වා කාල පරාසයක සිට අයවිය යුතුව තිබුණු ණය වාරික හා පොලී රු.622,202 ක් වී තිබුණි. එයින් සාමාජිකත්වය අහෝසි කිරීමේ ලිපි යවන ලද සාමාජිකයින් විසින් නොගෙවා තිබුණු ණය වාරික හා පොලී එකතුව රු.189,613 ක් වී තිබුණත්, එම සාමාජිකයන්ගෙන් අයවිය යුතුව තිබුණු මුළු ණය මුදලම අයකර ගැනීම අවිනිශ්චිත තත්ත්වයක පැවතුණි.

(ඇ) සාමාජිකයන් 31 ක් විසින් මාස 3 සිට අවුරුදු 1 දක්වා වූ කාල පරාසයක සිට එකතුව රු.109,743 ක් වූ දායක මුදල් ගෙවා නොතිබුණි.

(ඈ) රිත අංක 14 යටතේ ලබාදී තිබුණු ප්‍රදානමික ණය සඳහා ඉකුත් වර්ෂය අවසාන වනවිට රු.98,307 ක් ලැබිය යුතුව තිබුණු අතර, එම මුදල සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ලැබී නොතිබුණි.

### 1.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

(අ) පහත සඳහන් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| වර්ග නොකල ප්‍රේෂණ | 530,964 | කේවල ශේෂ ලයිස්තු |
| සාමාජිකත්වය අහෝසි වුවන්ගේ දායක මුදල් | 14,934,697 | |
| පොදු තැන්පත් | 311,267 | |
| සේවා සඳහා ලැබුණු අත්තිකාරම් | 82,445 | ශේෂ සනාථ කිරීමේ ලිපි |
| ගෙවිය යුතු ණය | 98,106 | |
| විවිධ ණයගැතියෝ | 846,085 | |
| සාමාජිකයින්ට ණය | 602,183,245 | කාල විශ්ලේෂණ |
| ආපසු ගෙවිය යුතු තැන්පත් | 65,985 | ගිවිසුම්, තැන්පතුවලට අදාළ මූලාශ්‍ර ලියවිලි |
| නීතිඥ ගාස්තු සහ තක්සේරු ගාස්තු | 75,965 | ණය ඉල්ලුම්කරුවන් පිළිබඳ විස්තර, කාල විශ්ලේෂණය |
| පසුගිය වර්ෂවල බඳවා ගත් සාමාජිකයින්ගෙන් අයවී තිබුණු අසම්භාව්‍ය සංචිතයට බැර කළ මුදල් | 28,900 | සාමාජිකයින් 289 ක් පිළිබඳ විස්තර |

(ආ) රාජ්‍ය සේවා අන්‍යොන්‍ය අර්ථසාධක සංගමයේ සංශෝධිත ව්‍යවස්ථාවේ 10 (අ) (ii) ඇ වගන්තිය ප්‍රකාර මරණ ප්‍රදාන වෘද්ධි සංචිත අරමුදලේ අතිරික්ත මුදල්, භාණ්ඩාගාරය විසින් අනුමත කරන සුරැකුම්වල ආයෝජනය කළ යුතු වුවද, සංගමයේ අරමුදලට අයත් මුදල් සහ වෙනත් අරමුදල් ගිණුම් යටතේ වු එකතුව රු.56,797,110 ක් 2012 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර බිල්පත් සහ ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණු නමුත් ව්‍යවස්ථාවේ පරිදි අනුමැතිය ලබාගෙන තිබුණු බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 1.2.5 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණයන්ට අනුකූල නොවීම

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තිරණයන් ආදියට අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණයන්ට යොමුව | අනුකූල නොවීම් |
| --- | --- |
| (අ) රාජ්‍ය සේවා අන්‍යොන්‍ය අර්ථසාධක සංගමයේ සංශෝධිත ව්‍යවස්ථාව | |
| (i) 19 (II ) වගන්තිය | සාමාජිකයින්ගේ සුභසාධනය සඳහා වැඩිහිටි නිවාසයක් පවත්වා ගෙනයාම සඳහා කළමනාකරණ කමිටුවට බලය ලැබී තිබුණු නමුත් එම කාර්ය මෙම වාර්තාවේ දිනය තෙක් ඉටු කර නොතිබුණි. |
| (ii) 10 (1) වගන්තිය | සාමාජිකයකුගේ මරණය දැනුම්දී මාස දෙකක් ඇතුළත ඔහුට හිමි ප්‍රදානය ගෙවිය යුතු වුවත්, විගණනයට ඉදිරිපත් කර තිබූ 2012 දෙසැම්බර් 31 දිනට මරණ පිළිබඳ වාර්තාවට අනුව මරණය දැනුම්දී මාස 02 ක් ඉක්මවු සාමාජිකයින් 93 කට ගෙවිය යුතුව තිබුණු මරණ ප්‍රදාන මුදල රු.4,180,000 ක් වී තිබුණි. එම ප්‍රදාන මුදල තුළ 2011 වර්ෂය හා ඊට පෙර වර්ෂවල මිය ගිය අයට පමණක් ගෙවිය යුතුව තිබුණු මරණ ප්‍රදාන මුදල රු.2,660,000 ක්වී තිබුණි. ඒ අනුව මරණයක් සිදුවීමෙන් පසුව සංගමයට දැනුම්දීම හෝ සංගමය විසින් සොයා බැලීමේ ක්‍රමවේදය ක්‍රියාත්මක වී නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සංගමයේ මෙහෙයුම් ප්‍රතිඵලය (බදුවලට පසු) රු.28,705,879 ක ශුද්ධ ලාභයක් වූ අතර, ඉකුත් වර්ෂයේ අනුරූපී (බදුවලට පසු) ශුද්ධ ලාභය රු.26,557,392 ක් වුයෙන් සමාලෝචිත වර්ෂය සඳහා සංගමයේ ලාභයෙහි රු.2,148,487 ක් හෙවත් සියයට 8.08 ක වර්ධනයක් පෙන්නුම් කර තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

#### (අ) සාමාජිකත්වය

2008 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා වු වසර 05 තුල සාමාජිකත්වය පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

| | 2008 | 2009 | 2010 | 2011 | 2012 |
|---|---|---|---|---|---|
| ජනවාරි 01 දිනට සාමාජිකත්වය | 10,897 | 10,727 | 10,664 | 10,947 | 10,982 |
| එකතු කළා : | | | | | |
| නව බඳවා ගැනීම් | 205 | 363 | 671 | 393 | 358 |
| නැවත සාමාජිකත්වය ලබාදීම | 36 | 48 | 35 | 22 | 13 |
| අඩු කළා : | | | | | |
| සාමාජිකත්වය අහෝසි වීම් | (411) | (474) | (423) | (380) | (262) |
| දෙසැම්බර් 31 දිනට සාමාජිකත්වය | 10,727 | 10,664 | 10,947 | 10,982 | 11,091 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරන ලැබේ.

(i) 2008 දෙසැම්බර් 31 දිනට 10,727 ක් වු සාමාජික සංඛ්‍යාව 2012 දෙසැම්බර් 31 දින වන විට 11,091 ක් දක්වා වැඩි වී තිබුණි. ඉකුත් වර්ෂ පහ තුළදී නව සාමාජිකයන් 1,990 ක් පමණක් බඳවා ගෙන තිබුණි. ඉකුත් වර්ෂ තුළ රාජ්‍ය සේවයට අළුතින් එක්වු පිරිස කිහිප ගුණයකින් වැඩිවී තිබුණු නමුත්, සාමාජිකත්වය වර්ධනය කර ගැනීම සඳහා විධිමත් වූ ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි.

(ii) වසර 05 තුළදී සාමාජිකත්වය අහෝසිවීම්වල එකතුව 1950 ක් වූ අතර එයින් 887 ක් හෙවත් සියයට 45.49 ක් සාමාජිකත්වයෙන් ඉල්ලා අස්වී තිබුණි. ඉල්ලා අස්වීම් පසුගිය වසර 05 ක කාලය තුල වර්ධනය වී තිබුණි.

(ආ) <u>සංවත්සර මහා සභා රැස්වීම්වලට සාමාජිකයින්ගේ පැමිණීම</u>

සංවත්සරික මහා සභා රැස්වීමේදී සංගමයේ පාලක සභාව සඳහා සාමාජිකයින් තෝරාපත්කර ගනු ලැබූවද, එම සංවත්සරික රැස්වීම් වලට සාමාජිකයින්ගේ පැමිණීම ඉතා අඩු මට්ටමක පැවතුණි. මේ නිසා සංගමයේ පාලක සභාවට සාමාජිකයින් තෝරාගැනීම සහ සංවත්සර රැස්වීමේදී යෝජනා සඳහා දායකත්වය ලබාදීමේදී වැඩි සාමාජිකයින්ගේ නියෝජන මත සිදුවී නොතිබුණි. සමාලෝචිත වර්ෂය හා පසුගිය වර්ෂ හයක සංවත්සර රැස්වීමට සාමාජිකයින්ගේ පැමිණීම සියයට 12 සිට සියයට 9 දක්වා ක්‍රමයෙන් අඩු වී තිබුණි.

## 3.2 <u>ණය කළමනාකරණයේ අකාර්යක්ෂමතා</u>

(අ) නියැදි පරීක්ෂාවකදී සාමාජිකත්වයෙන් ඉවත් වූ හෝ මියගිය සාමාජිකයින් 9 දෙනෙකුගේ පාස්පොත්වල ඍණ ශේෂ තිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) සංගමය විසින් සාමාජිකයින්ගේ මූලික වැටුප පදනම් කරගෙන දායක මුදල් අයකර තිබුණු නමුත් එම අයගේ වැටුප් වර්ධක, වැටුප් සංශෝධන අනුව මූලික වැටුප වැඩිවී තිබුණු අවස්ථාවලදී එම සංශෝධිත වැටුප් මත දායක මුදල් අයකිරීමට පියවර ගෙන නොතිබුණු බව නියැදි පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. ඒ හේතුවෙන් සංගමයට ලැබෙන දායක මුදල් ලැබීම් වල අඩුවීමක් සිදුවී තිබුණි.

(ඇ) දායක මුදල් ගෙවීම පැහැර හැර තිබුණු සාමාජිකයෙකු හිඟ දායක මුදල් එකවර ගෙවීමෙන් පසු 2012 මාර්තු මාසයේදී රු.75,000 ක පරිගණක ණයක් ලබාදී තිබුණි. එම සාමාජිකයාගේ තැන්පතු ගිණුම්වල රු.10,670 ක ශේෂයක් පමණක් පැවතුණු අතර, ණය මුදල ලබාගැනීමෙන් පසුව ඔහු විසින් දායක මුදල්, ණය වාරික, හා පොලී ගෙවා නොතිබුණි. එම ණය මුදල අයකර ගැනීම සඳහා පසුවිපරම් කටයුතු සිදු කර නොතිබුණි.

(ඇ) සාමාජිකයකු හට 2012 අගෝස්තු මස සාමාජික ණය රු.11,610 ක්ද, වැටුප් ණය රු.15,000 ක්ද, උත්සව අත්තිකාරම් රු.10,000 ක්ද, දුරකථන ණය රු.10,000 ක්ද, විශේෂ පොත් ණය රු.10,000 ක්ද හා පරිගණක ණය රු.75,000 ක්ද ලබාගෙන තිබුණු අතර, සැප්තැම්බර් හා නොවැම්බර් මාසවල පොලීද නියමිත මාසයට අදාළව අයවී නොතිබුණු අතර හිඟ මුදල් ගෙවීමක්ද සිදු කර නොතිබුණි.

(ඉ) 2012 වර්ෂයේදී දේපළණය ලබාදී තිබූ සාමාජිකයන් 75 ක් අතරින් ණය ලිපිගොනු 40 ක් පිළිබඳව කරන ලද නියැදි පරීක්ෂාවේදී සාමාජිකයින්ගේ දේපළ පිළිබඳව සිදුකර තිබූ තක්සේරු වාර්තා 10 ක තක්සේරු කරන ලද තක්සේරුකරුගේ නිල මුද්‍රාව යොදා නොතිබුණි.

(ඊ) 2012 අගෝස්තු මස දේපළ ණය ලබාගෙන තිබුණු සාමාජිකයකු විසින් ණය වාරික ගෙවා නොතිබුණු අතර, ඒ පිළිබඳ පසුවිපරම් කටයුතු සිදු කර නොතිබුණි.

(උ) දේපළ ණය ලබාදී තිබුණු ලිපිගොනු 33 ක් වේයන් කෑම නිසා විනාශ වී තිබුණි. මේ සම්බන්ධයෙන් නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(i) සමහර ලිපිගොනු සම්පූර්ණයෙන් වේයන් කා තිබුණු බැවින් ලිපිගොනු ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ii) විනාශ වූ දේපළ ණය ලිපිගොනුවල ඡායා පිටපත් සකස් කිරීම සඳහා මුදල් වැය කිරීමෙන් සංගමයට පාඩුවක් සිදුවී තිබුණි.

(ඌ) සංගමය විසින් ප්‍රමාද වී දේපල ණය ලබා ගැනීමට කැමති සාමාජිකයන්ගෙන් පමණක් ඉල්ලුම්පත් ලබා ගැනීමට තීරණය කර තිබුණු අතර, 2013 පෙබරවාරි 15 දින වනවිට ඉල්ලුම්පත් 16 ක් පොරොත්තු ලේඛනයේ පැවතුණි. එසේම පෙර වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී දේපළ ණය ගෙවීම සියයට 28 කින් අඩුවී තිබුණි. මෙලෙස පොරොත්තු ලේඛනයේ රැඳී සිට ණය ලබාගැනීමට කැමති අයගෙන් පමණක් ණය අයදුම්පත් ලබා ගැනීමද, මාස කිහිපයක් පොරොත්තු ලේඛනයේ රැඳී සිටීමට සිදුවීම සාමාජිකයින් සංගමයෙන් ඉවත්වීමට බලපා තිබුණු බව නිරීක්ෂණය විය. මේ සම්බන්ධයෙන් සංගමයේ ප්‍රධාන අරමුණ වන්නේ සාමාජිකයන්ගේ කෙටිකාලීන මූල්‍ය අවශ්‍යතා සඳහා සහනයක් සැලැස්වීම බව ඒකාබද්ධ ලේකම් විසින් විගණනය වෙත දැනුම් දී ඇත.

## 3.3 <u>සාප්පු හා කාර්යාල සේවක පනතේ විධිවිධානයන්ගෙන් බැහැර වීම</u>

සංගමය විසින් පිළියෙල කර තිබුණු කාර්ය පරිපාටි සංග්‍රහයට අනුව, 2010 ජූලි 21 දින සිට වසර 02 ක් ගත වීමෙන් පසු සාප්පු හා කාර්යාල සේවක පනතේ විධිවිධාන සංගමයේ සිටින සියළු කාර්ය මණ්ඩලයට අදාල වුවද, කාර්ය මණ්ඩලයේ සමහර නිලධාරීන් මෙම කාර්ය පරිපාටි සංග්‍රහයේ විධිවිධාන අනුගමනය නොකර, තවදුරටත් රාජ්‍ය නිලධාරීන්ට හිමි වාසි හා වරප්‍රසාද භුක්ති විඳීමට ඉඩ සලසා තිබුණි.

## 3.4 ඒකාබද්ධ ලේකම් හා භාණ්ඩාගාරික තනතුර පුරප්පාඩුව පැවතීම

සංගමයේ කාර්ය පරිපාටි සංග්‍රහයේ II වන පරිච්ඡේදයේ 1 හා 2 වගන්ති පරිදි ඒකාබද්ධ ලේකම් හා භාණ්ඩාගාරික තනතුර සංගමයේ ප්‍රධාන පරිපාලන නිලධාරී වේ. සංගමයේ ඒකාබද්ධ ලේකම් හා භාණ්ඩාගාරික තනතුර සඳහා නිලධාරියෙකු 2011 ජුනි 01 දින සිට පත්කර නොතිබුණු අතර සහකාර ලේකම් වශයෙන් බඳවාගෙන තිබුණු නිලධාරිනිය එදින සිට ඒකාබද්ධ ලේකම් හා භාණ්ඩාගාරික තනතුරෙහි වැඩ බැලීමට කටයුතු කර තිබුණි. සංගමයේ ප්‍රධාන පරිපාලන නිලධාරී තනතුරු වසර 1 1/2 කට වැඩි කාලයක් පුරප්පාඩුව පැවතුණි.

## 3.5 ආර්ථික නොවූ ගනුදෙනු

සංගමය විසින් රජයේ බැංකුවක සුරක්ෂිතාගාරයක් 1995 වර්ෂයේ සිට පවත්වා ගෙන තිබුණු අතර, ඒ සඳහා රු.10,000 ක තැන්පතුවක්ද තබා තිබුණි. තවද සුරක්ෂිතාගාරය සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.4,000 ක ගාස්තුවක් ගෙවා තිබුණි. දැනට ආයතනයේ සියළු ලිපි ලේඛන සංගමයට අයත් ගොඩනැගිල්ලේ පවත්වා ගෙන තිබුණු බැවින්, මුදල් වැය කරමින් සුරක්ෂිතාගාරයක් පවත්වා ගැනීමේ අවශ්‍යතාවක් නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 3.6 මරණ ප්‍රදාන අරමුදල

සංශෝධනය කරන ලද ව්‍යවස්ථාවේ 10(අ)(ii) වගන්තිය අනුව මරණ ප්‍රධාන වෘද්ධි සංචිත අරමුදලේ අතිරික්ත මුදල් අනුමත කරන ලද ආයෝජනයන්හි යෙදීම සඳහා හෝ සාමාජිකයින්ට ණය ගෙවීම සඳහා යොදා ගැනීමට තීරණය කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය ආරම්භයට එම සංචිත අරමුදලේ ශේෂය රු.55,195,648ක් විය. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යවස්ථාවේ 10(අ)(ii)අ වගන්තියට අනුව මරණ ප්‍රධාන වෘද්ධි සංචිත අරමුදලෙහි අරමුදලට අයත් මුදල්, එයින් ආයෝජනය කරන මුදල්, ආයෝජන වලින් ලැබෙන පොලිය, ණය ගෙවීම සඳහා යොදාගත් මුදල් ප්‍රමාණය, ඒ සඳහා වූ පොලිය හා පරිපාලන වියදම් සඳහා ගෙවන ලද සියයට 1 ක මුදල වෙනම හඳුනාගත හැකි වන පරිදි ගිණුම් හා වාර්තා පවත්වා නොතිබුණි.

(ආ) මරණ ප්‍රදාන ගෙවීමේදී මාස 3 සිට වසර 45 දක්වා වූ කාල ප්‍රමාදයන් පැවතුණි. වර්ෂ 05 කට වැඩි කාලයට අයත් රු.1,515,100 වෘද්ධි ප්‍රදාන සංචිත අරමුදලට බැරකර තිබුණි. මේ නිසා ගෙවිය යුතු මරණ ප්‍රදාන සම්පූර්ණ ප්‍රමාණය ගිණුම්වලින් අනාවරණය වී නොතිබුණි.

## 3.7 පරිගණක පද්ධතියේ දුර්වලතා

සංගමයේ කාර්යයන් ඉටු කිරීමට අදියර 05 කින් යුත් පරිගණක වැඩ සටහනක් සකස් කිරීම සඳහා රු.970,000 ක කොන්ත්‍රාත්තුවක් පුද්ගලික සමාගමකට ප්‍රදානය කර තිබුණි. එහි පළමු අදියර සඳහා ඉකුත් වර්ෂයේදී රු.225,000 ක් ගෙවා තිබුණි. ඉන්පසු එම කොන්ත්‍රාත්තුවේ අනෙකුත් අදියරයන් ක්‍රියාත්මක කර නොතිබුණි. ක්‍රියාත්මක කර තිබුණු පරිගණක වැඩ සටහනේ පහත සඳහන් කාර්යයන් ඉටුවී නොතිබුණි.

(අ) අවසන් ගිණුම් සකස් කිරීමට හැකි වැඩ සටහනක් ස්ථාපිත කළ යුතු වුවත්, ලබාදී තිබුණු පරිගණක වැඩ සටහන මගින් අවසන් ගිණුම් සකස් කිරීමට නොහැකි වී තිබුණි.

(ආ) සාමාජිකයින් පිළිබඳව පරිගණකයේ දැක්වෙන තොරතුරු සංගමයේ පැවති තොරතුරු සමඟ සසඳා නොතිබුණි.

## 4. ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය

### 4.1 පාලන කමිටුවල දායකත්වය

සංගමයේ යහපාලනයට පාලන කමිටුවල දායකත්වය සහ පාලන කමිටු රැස්වීම්වලට සාමාජිකයින්ගේ සහභාගිත්වය සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පවත්වා තිබුණු මාසික හා විශේෂ පාලන කමිට 18 කින් භාණ්ඩාගාරය විසින් පත්කළ එක් නියෝජිතයෙකු රැස්වීම් 10 කට පමණක් සහභාගී වී තිබූ අතර, අනෙක් නියෝජිතයා 2011 දෙසැම්බර් මාසයෙන් පසු ඉල්ලා අස්වී තිබුණත්, ඒ සඳහා කිසිවකු පත්කර නොතිබුණි.

(ආ) කමිටුවලට පැමිණීම් විස්තර අනුව මාසික පාලන කමිටු අතිරේක පාලන කමිටු සහ අනුකමිටුවලට පත්වූ සමහර සාමාජිකයින් එම කමිටුවල රැස්වීම්වලට සහභාගි වීම දුර්වල වී තිබුණි.
මේ නිසා සංගමයේ අභිවෘද්ධිය සඳහා තීරණ ගැනීමේදී සමහර කමිටු සාමාජිකයින්ගෙන් ප්‍රමාණවත් දායකත්වයක් සංගමයට ලැබී නොතිබුණි.

### 4.2 සංයක්ත සැලැස්ම, ක්‍රියාකාර් සැලැස්ම සහ එහි ක්‍රියාකාරීත්වය

සමාලෝචිත වර්ෂය සඳහා සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

### අභ්‍යන්තර විගණනය

සංගමයේ අභ්‍යන්තර විගණනය සඳහා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් යොදවා ඵලදායී විගණනයක් සිදු කර නොතිබුණි.

## 4.3 <u>අයවැය ලේඛනමය පාලනය</u>

අයවැය ලේඛනය හා තථ්‍ය සංඛ්‍යා අතර විෂයන් 48 ක සියයට 10 සිට සියයට 1787 දක්වා වූ සැලකිය යුතු විචලනයක් පැවති බැවින් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදවා ගෙන නොතිබුණි.

## 5. <u>පද්ධති හා පාලන</u>

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතාවයන් වරින් වර සංගමයේ ඒකාබද්ධ ලේකම් සහ භාණ්ඩාගාරිකගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) පරිගණක පද්ධතිය
(ආ) මරණ ප්‍රදාන පරිපාටිය
(ඇ) ගොඩනැගිලි අරමුදල
(ඈ) සාමාජිකත්වය වර්ධනය කරගැනීම
(ඉ) අයවැය ලේඛනය
(ඊ) සාමාජික ණය
(උ) ස්ථාවර වත්කම්
(ඌ) පාලන කමිටු ක්‍රියාකාරීත්වය